**මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. සහ එහි පරිපාලිතය - 2021**
---------------------------------------------------------------------------------------------------

## 1.1 මතය

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීරණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන්, සාරාංශ ගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මර්චන්ට් බෑන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පී.එල්.සී. හි ("සමාගම") සහ සමාගමේ සහ එහි පරිපාලිතයේ ("සමූහය") "හි මූල්‍ය ප්‍රකාශන සහ සමාගමේ හා එහි පරිපාලිතයේ ("සමූහය") ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය සිදු කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ වෘත්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහය මා ලබා ගන්නා ලදී.

සමාගමේ සහ සමූහයේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමූහය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමූහය ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ හා සමූහයේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්ම සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අනාවරණය කරගන්නා බවට වන

ඇපවීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමූහයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ නිගමනයන් මාගේ විගණකගේ වාර්තාවේ දින තෙක් ලබාගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකි වන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාල ලිඛිත නීතියකට හෝ සමූහයේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමූහය ක්‍රියා කර ඇති බව;

- සිය බලතල, කර්තව්‍ය හා කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව;

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස හා ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ**

**1.5.1 ගිණුම්කරණ අඩුපාඩු**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ලැබිය යුතු පොලී රුපියල් මිලියන 8 ක් වූ ඍණ ශේෂයන් සහිත ණය පහසුකම් 1510 ක් විය. | එවැනි පහසුකම් හඳුනාගැනීම සඳහා නිසි ක්‍රමවේදයක් ක්‍රියාත්මක වේ. වරින් වර සමාලෝචනයක් සිදු කරන අතර අවශ්‍ය ගැලපීම් නිරන්තරයෙන් සිදු කරනු ලැබේ. දැනට පවතින පහසුකම් සංඛ්‍යාව 07ක් පමණි.<br>**වගකිවයුතු නිලධාරියා -** සීසීඩී අංශ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්වය -** ක්‍රියාත්මක කරන ලදී<br>**කාල නියමය -** සම්පූර්ණයි | එවැනි ශේෂයන් හඳුනාගෙන අවශ්‍ය නිසි ක්‍රමවේදයක් පිහිටුවීමට සහ අවශ්‍ය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම නිර්දේශ කෙරේ. |

**1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්**

**1.6.1 ලැබිය යුතු මුදල්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | හින්ගරා ටවුන් ඇන්ඩ් කන්ට්‍රි ක්ලබ් (පුද්ගලික) සමාගම" වෙතින් ලැබිය යුතු රුපියල් 11,139,311 ක් වූ දිගු කාලීන හිඟ ශේෂයක් පැවති අතර මේ සම්බන්ධයෙන් කිසිදු ප්‍රතිපාදනයක් සිදුකර නොමැත. | මේ සම්බන්ධයෙන් නඩු විභාගයක් සිදු වෙමින් පවතිව අතර එම නඩු විභාගය අවසන් වන තුරු ලැබිය යුතු පොළී ශේෂය පවත්වා ගෙන යාම අවශ්‍ය වේ.<br>**වගකිවයුතු නිලධාරියා -** නීති අංශයේ ප්‍රධානියා / මූල්‍ය අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්වය**<br>නඩුවේ ප්‍රතිඵලය ලැබෙන තුරු ශේෂය රඳවා තබා ගනු ලැබේ.<br>**කාල නියමය -** නඩු තීන්දුව මත නීති ක්‍රියාමාර්ගය රඳා පවතී . | දීර්ඝ කාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අවශ්‍ය කටයුතු කල යුතු බව නිර්දේශ කෙරේ. |

**1.6.2 ගෙවිය යුතු මුදල්**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | පාරිභෝගික එකතු කිරීමේ ගිණුම්වල ද, හඳුනා නොගත් ඍජු තැන්පතු, වැටුප් පාලන සහ එම්එෆ් ගෙවිය යුතු - එම්ඕයූ ගිණුම්වල වසර 1 සිට 5 දක්වා වූ කාලයක් සඳහා එකතුව රුපියල් 133,225,640 දීර්ඝ කාලයක සිට හිඟව පවතින ශේෂ නිරීක්ෂණය විය.එම හිඟ ශේෂයන් නිරවුල් කිරීමට අදාල බලධාරීන් ක්‍රියා කර නොමැති අතර එම ශේෂයන් පිළිබඳ කාල විශ්ලේෂණය පහත වගුවේ දක්වා ඇත. | <u>**ලෙජර් ගිණුම් අංක 20111**</u><br><u>**රු.102,642,280 –**</u><br>විසඳීමට බලාපොරොත්තුවෙන් පසුවන නඩු වලින් ලැබිය ලැබීම් වේ. නඩු ක්‍රියාමාර්ග අවසන් වන තුරු මෙම මුදල ගිණුම් පොත්වල තබා ගත යුතුය.<br>**වගකිවයුතු නිලධාරියා -** නීති අංශයේ ප්‍රධානියා / ප්‍රතිසාධන අංශයේ ප්‍රධානියා / මූල්‍ය අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්වය** නඩු විභාගය සමථයකට පත් වීමට නියමිතයි. | දීර්ඝ කාලීන හිඟව පවතින ශේෂ නිරවුල් කිරීමට නිර්දේශ කෙරේ. |

**කාල නියමය-** අදාළ නොවේ.

**<u>රු. 833,280</u>** – ගනුදෙනුකරුවන් විසින් පහසුකම් පියවීමෙන් පසු ඉතිරි මුදල වේ. අදාළ පාරිභෝගික ස්පර්ශ ස්ථානවලින් තහවුරු කිරීම ලැබුණු පසු මෙම ශේෂයන් ගිණුම් පොත්වලින් ඉවත්කළ හැකිය.

**වගකිවයුතු නිලධාරියා -** ප්‍රතිසාධන අංශයේ ප්‍රධානියා

/ මූල්‍ය අංශයේ ප්‍රධානියා

**2022.12.31 දිනට තත්වය** කළමනාකාරීත්වයේ අදහස් දන්වා ඇති පරිදි නිර්දේශ අනුගමනය කරනු ලැබේ.

**කාල නියමය -** ඉදිරියට පවතී

**<u>රු. 507,779</u> -** රෝගී පාරිභෝගිකයින් සඳහා ආපසු ගෙවිය යුතුය ණයකර වටිනාකම වේ. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව මෙම ශේෂයන් නිරවුල්කිරීමට සමාගම කටයුතු කරමින් සිටී.

**වගකිවයුතු නිලධාරියා -** ආයතනික උපදේශන අංශ ප්‍රධානියා **/**මූල්‍ය අංශයේ ප්‍රධානියා

**2022.12.31 දිනට තත්වය –**

සිදු කරමින් පවතී

**කාල නියමය -** 2023.03.31

**<u>රු.612,639 –</u>**

රු. 583,351 ක් වූ සමුච්චිත මුදල 2017 ට පෙර සිදු වූ ගනුදෙනු සඳහා අදාළ වේ. දිගු කාලීන හිඟ ශේෂයන් නිරවුල් කිරීමේ ප්‍රතිපත්තියට අනුව, අභ්‍යන්තර විගණන අංශයේ සත්‍යාපනය සහ නිර්දේශයෙන් සහ අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියෙන් පසුව එම මුදල නිරවුල් වෙමින් පවතී.

**වගකිවයුතු නිලධාරියා -** මූල්‍ය අංශයේ ප්‍රධානියා**.**

**2022.12.31 දිනට තත්වය** කළමනාකාරීත්වයේ අදහස් දන්වා ඇති පරිදි නිර්දේශ අනුගමනය කරනු ලැබේ.

**කාල නියමය -** ඉදිරියට පවතී.

**<u>ලෙජර් ගිණුම් අංක 20113</u>**

අභ්‍යන්තර විගණන අංශයේ සත්‍යාපනය හා නිර්දේශයෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව නිරවුල් කරන ලද ශේෂයන් නිරවුල් කෙරේ.

**වගකිවයුතු නිලධාරියා -** මූල්‍ය අංශයේ ප්‍රධානියා**.**

**2022.12.31 දිනට තත්වය** කළමනාකාරීත්වයේ අදහස් දන්වා ඇති පරිදි නිර්දේශ අනුගමනය කරනු ලැබේ.

**කාල නියමය -** ඉදිරියට පවතී.

**<u>ලෙජර් ගිණුම් අංක 10361</u>**

මේවා විනය හේතුන් මත සේවකයින්ට (වැටුප් රඳවා තබා ගැනීම) ගෙවා නොමැති වැටුප්වලට අදාළ දිගු කාලීන හිඟ ශේෂයන් වේ. පරීක්ෂණ අවසන් වූ පසු සේවකයාට හිමි වැටුප් ගෙවීම හෝසේවකයාගෙන් කිසියම් හිඟයක් මුදලක් අය කර ගැනීම සිදු කරනු ලැබේ.

**වගකිවයුතු නිලධාරියා -** මානව සම්පත් අංශයේ ප්‍රධානියා/ මූල්‍ය අංශයේ ප්‍රධානියා**.**

**2022.12.31 දිනට තත්වය** කළමනාකාරීත්වයේ අදහස් දන්වා ඇති පරිදි නිර්දේශ අනුගමනය කරනු ලැබේ.

**කාල නියමය -** ඉදිරියට පවතී.

**<u>ලෙජර් ගිණුම් අංක.10186</u>**

මෙම ශේෂයන් නියඟයෙන් පීඩාවට පත් දිස්ත්‍රික්කවල ගනුදෙනුකරුවන්ට ක්ෂුද්‍ර මූල්‍ය ණය සඳහා විශේෂ ණය සහන ලබාදීමේ වැඩසටහනට අදාල වේ. අභ්‍යන්තර විගණන අංශයේ සත්‍යාපනය හා නිර්දේශයෙන් පසුව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ඇතිව එම මුදල් නිරවුල් කරනු ලැබේ.

**වගකිවයුතු නිලධාරියා -** මානව සම්පත් අංශයේ ප්‍රධානියා/ මූල්‍ය අංශයේ ප්‍රධානියා**.**

**2022.12.31 දිනට තත්වය** කළමනාකාරීත්වයේ අදහස් දන්වා ඇති පරිදි නිර්දේශ අනුගමනය කරනු ලැබේ.

**කාල නියමය -** ඉදිරියට පවතී.

### 1.6.3 අත්තිකාරම්

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 දෙසැම්බර් 31 වන දිනට ප්‍රධාන අක්‍රීය ගණුදෙනුකරුවන් 10 දෙනාගේ මුළු හිඟ මුදල රු. මිලියන 1,183.91 ක් වූ අතර එය එම දිනට බැංකුවේ අක්‍රීය දළ ණය හා අත්තිකාරම් වලින් සියයට 22.12 ක් නියෝජනය කරයි. විස්තර පහත පරිදි වේ. | පසුවිපරම්. බේරුම්කරණ සාකච්ඡා සහ නඩු කටයුතු සිදු වෙමින් පවතී. ප්‍රතිසාදන රැස්වීම් වලදී ප්‍රගතිය නිරන්තරයෙන් නිරීක්ෂණය කරනු ලැබේ. ගම්පහ ඩිවලොප්මන්ට් (පුද්) සමාගම සම්පූරණයෙන් ගෙවා නිම කර ඇති අතර | ගණුදෙනුකරුවන් ගෙන් ලැබිය යුතු සම්පූර්ණ මුදල අයකර ගැනීමට බැංකුව විසින් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන ඇති බව සහතික කිරීමට නිර්දේශ |

| අංකය | ගණුදෙනුකරුගේ නම | මුළු හිඟ මුදල (රු. මිලියන |
|---|---|---|
| 1 | මැග් ස්ටෝරේජ් බැටරි (පුද්) සමාගම | 295.24 |
| 2 | ඒ පී ඒ ජුවලරි (පුද්) සමාගම | 260.69 |
| 3 | ඔරු මික්ස් ඇස්පහල්ට් (පුද්) සමාගම | 121.71 |
| 4 | දයා ගෘප් (පුද්) සමාගම | 114.25 |
| 5 | වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම | 109.26 |
| 6 | වැවිලි සංවර්ධන සහ කළමණාකරන (පුද්) සමාගම | 76.09 |
| 7 | සීගිරිය වයිස්රෝයි හොටෙල් (පුද්) සමාගම | 62.62 |
| 8 | ගම්පහ ඩිවලොප්මන්ට් (පුද්) සමාගම | 59.02 |
| 9 | ප්‍රිමියර් ජල අලෙවිකරණ (පුද්) සමාගම | 50.48 |
| 10 | අනුර මැන් පවර් සප්ලයිස් (පුද්) සමාගම | 34.55 |
| **එකතුව** | | **1,183.91** |

මැග් ස්ටෝරේජ්, ඒ පී ඒ ජුවලරි, සහ වෝකර්ස් සන්ස් ඇන්ඩ් කම්පැනි ඉංජිනියරින් (පුද්) සමාගම ගෙවා නිම කිරීම සඳහා සාකච්ඡා කරමින් පවතී.

**වගකිවයුතු නිලධාරියා -** ප්‍රතිසාධන අංශයේ ප්‍රධානියා

**2022.12.31 දිනට තත්වය –**

ගම්පහ ඩිවලොප්මන්ට් (පුද්) සමාගම සම්පූර්ණයෙන්ම ගෙවා නිම කර ඇත. මැග් ස්ටෝරේජ්, ඒ පී ඒ ජුවලරි සහ වෝකර්ස් සන්ස් සමථයකට පත් කිරීමට සාකච්ඡා කරමින් පවතී.

**කාල නියමය -** ඉදිරියට පවතී.

කෙරේ.

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල

| අංකය | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (i) | 2006 අංක 4 දරන මූල්‍ය සමාගම් මාර්ගෝපදේශය, වගන්තිය 5 **(**තනි ණයගැති සීමාව**)** | 2021 දෙසැම්බර් 31 දිනට පහත සඳහන් අවස්ථාවලදී මූලික ප්‍රාග්ධනයෙන් 1% (රු. මිලියන 41.86) ඉක්මවා ණය ගැනුම්කරුට අනාරක්ෂිත ණය සහ අත්තිකාරම් ලබා දීමෙන් සමාගම විසින් උපුටා දක්වන ලද නියෝගය උල්ලංඝනය කර ඇත. | එම්බීඑස්එල් රක්ෂණ සමාගමේ බලපත්‍රය 2017 දී අත්හිටුවන විට සමාගම පුනර්ජීවනය කිරීම සඳහා මෙම සුවිශේෂී පහසුකම ලෙස ලබා දෙන ලදී. මෙම පහසුකම් ලබා නොදීම සමාගමේ පැවැත්මට බලපානු ඇති බැවින් මව් සමාගම ලෙස සමාගමේ මෙහෙයුම් කළමනාකරණය කිරීම සඳහා පහසුකම ලබා දෙන ලදී. කෙසේ වෙතත්, සමාගම එහි මෙහෙයුම් සිදු කරමින් පවතින අතර 2022.11.30 වන විට පහසුකමේ ප්‍රාග්ධනය රුපියල් මිලියන 65.96 දක්වා අඩු වීම, පහසුකම මත රුපියල් මිලියන 11.65ක මාසික ප්‍රාග්ධන අඩුවීමක් සහ සම්පූර්ණ හිඟ මුදල් 2023 මැයි හෝ ඊට පෙර පියවනු ඇත ඇති බව සැලකිය යුතු කරුණකි. 2023 මාර්තු මාසයේදී ප්‍රාග්ධන අනුපාතය ලබා | උපුටා දක්වන ලද මඟපෙන්වීම් අනුව අදාළ අනුකූලතා සපුරා ඇති බව සහතික කිරීමට නිර්දේශ කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| | | | කරගනු ඇත. ඉහත අවශ්‍යතාවයන්ට අනාගතයේදී අනුකූල වන්නේ දැයි අප සොයා බලනු ඇත.<br>**වගකිවයුතු නිලධාරියා -** මධ්‍යම ණය අංශ ප්‍රධානියා **2022.12.31 දිනට තත්වය –**<br>සිදු කරමින් පවතී<br>**කාල නියමය -**<br>2023.05.31 | |
| ආ | 2006 අංක 4 දරන මූල්‍ය සමාගම් මාර්ගෝපදේශය, වගන්තිය 5 (සමුච්චිත අනාරක්ෂිත පහසුම්) | 2021 දෙසැම්බර් 31 දිනට සමාගම එහි මූලික ප්‍රාග්ධනයෙන් සියයට 5 ඉක්මවා මුළු අනාරක්ෂිත ණය පහසුකම් ලබා දීම හේතුවෙන් උපුටා දක්වන ලද නියෝගය උල්ලංඝනය වී ඇත. එනම් ප්‍රාග්ධන අරමුදල්වලින් සියයට 11.6 ක් අනාරක්ෂිත ණය සහ අත්තිකාරම් ලෙස ලබා දී ඇත. | 2021.12.31 දිනට ලබා දී ඇති කළඹ නැවත පරීක්ෂාවට ලක් කරන ලද අතර භෞතික ණය ගොනු සමඟ පද්ධතිය තුළ දත්ත පිරිසිදු කිරීමක් සිදු කරන ලද අතර සමහර අඩුපාඩු නිවැරදි කරන ලදී. 2021.12.31 දිනට රුපියල් මිලියන 532.62ක් වූ අනාරක්ෂිත පහසුකම් 2022.10.31 වන විට රුපියල් මිලියන 107.29 දක්වා අඩු වී ඇත.<br>**වගකිවයුතු නිලධාරියා -** මධ්‍යම ණය අංශ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්වය –**<br>නිවැරදි කර ඇත.<br>**කාල නියමය -**<br>සම්පූර්ණයි. | උපුටා දක්වන ලද මඟපෙන්වීම් අනුව අදාළ අනුකූලතා සපුරා ඇති බව සහතික කිරීමට නිර්දේශ කරනු ලැබේ. |
| ඇ | කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත රීති අංක 7.13.1 (අ) | 2021 ඔක්තොම්බර් 1 දින 358,655,096 ක හිමිකම් කොටස් නිකුතුව හේතුවෙන් 2021 නොවැම්බර් 1 දින සිට බලපාන පරිදි සියයට 20 අවම මහජන හිමිකාරිත්වයේ අවශ්‍යතාවට අනුගත වීමට සමාගමට නොහැකි වීම. සමාගමේ නව හිමිකම් කොටස් නිකුතුව හේතුවෙන් මහජන කොටස් හිමිකාරීත්වට සියයට 15.50 ක් දක්වා පහළ ගොස් ඇත. | ලැයිස්තුගත කිරීමේ රීතිය 7.14.3 (ඉ) ප්‍රකාරව, අවම මහජන හිමිකාරිත්වයේ අවශ්‍යතාවට අනුගත වීමට එම්බීඑස්එල් වෙත 2022 නොවැම්බර් 1 දක්වා වසරක දිගුවක් කොළඹ කොටස් හුවමාරුව විසින් ලබා දී ඇත. ඒ අනුව 2022 නොවැම්බර් 1 වන දින අනුකූල නොවන දිනය ලෙස සලකනු ලබූ ලැයිස්තුගත කිරීමේ රීතිය 7.14..2 (1) (ආ) ප්‍රකාරව එම්බීඑස්එල් වෙත 2022 නොවැම්බර් 1 වන දින සිට අවම මහජන හිමිකාරිත්වයේ අවශ්‍යතාවට අනුකූල වීමට තවත් මාස හයක කාලයක් ලබා දී ඇත.<br>**වගකිවයුතු නිලධාරියා** -සමාගම් ලේකම්<br>**2022.12.31 දිනට තත්වය –**<br>නිර්දේශ ඉටු කරමින් පවතී.<br>**කාල නියමය -**<br>සම්පූර්ණයි. | උපුටා දක්වන ලද මඟපෙන්වීම් අනුව අදාළ අනුකූලතා සපුරා ඇති බව සහතික කිරීමට නිර්දේශ කරනු ලැබේ. |

| | | | | |
|---|---|---|---|---|
| ඇ | ලියාපදිංචි මූල්‍ය සමාගම් සඳහා වූ 2008 අංක 3 දරන මූල්‍ය සමාගම් මාර්ගෝපදේශය, වගන්ති **7**(9). (සාමූහික පාලනය) | ප්‍රධාන කළමනාකාරීත්වයේ හෝ වෙනත් විධායක රාජකාරි ඍජු අධීක්ෂණයට සම්බන්ධ ක්‍රියාකාරකම්වල නිරත වීම සභාපතිවරයාට තහනම් වුවද, අලුතින් පත් වූ ප්‍රධාන විධායක නිලධාරියා සඳහා රුපියල් මිලියන 1.5 සිට රුපියල් මිලියන 0.4 දක්වා පරාසයක වැටුප් හා දීමනා සාකච්ඡා කිරීමට සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය සභාපතිවරයාට බලය පවරා ඇති බව නිරීක්ෂණය විය. | ආයතනයේ මානව සම්පත් බඳවා ගැනීමේ ප්‍රතිපත්තියට අනුව, ප්‍රධාන කළමනාකරු සහ ඊට ඉහළ තනතුරු සඳහා සම්මුඛ පරීක්ෂණ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් පැවැත්විය යුතුය. එසේම ප්‍රධාන විධායක නිලධාරියාගේ වාර්තා කිරීමේ අධිකාරිය වන්නේද අධ්‍යක්ෂ මණ්ඩලයයි. එබැවින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නව ප්‍රධාන විධායක නිලධාරියා සඳහා වැටුප් පැකේජයක් සාකච්ඡා කිරීමට සභාපතිවරයාට ඒකමතිකව බලය ලබා දෙන ලදී.<br>**වගකිවයුතු නිලධාරියා** -සමාගම් ලේකම්<br>**2022.12.31 දිනට තත්වය** –<br>නිර්දේශ ඉටු කරමින් පවතී.<br>**කාල නියමය -**<br>සම්පූර්ණයි. | උපුටා දක්වන ලද මගපෙන්වීම් අනුව අදාළ අනුකූලතා සපුරා ඇති බව සහතික කිරීමට නිර්දේශ කරනු ලැබේ. |
| ඉ | කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත රීති අංක 7.10.2 | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ විධායක නොවන සහ ස්වාධීන නොවන අධ්‍යක්ෂවරයෙකු ලෙස එම්.පී. රුවන් කුමාර මහතා පත් කිරීමත් සමඟ 2021 අප්‍රේල් 20 දින සිට මාස තුනක කාලය සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයේ සිටිය යුතු ස්වාධීන අධ්‍යක්ෂවරුන් සංඛ්‍යාවට අනුකූලතාවය දක්වා නොමැත. | 2021 ජූලි 20 වැනි දින වරුණ ජයසිංහ මහතා ස්වාධීන විධායක නොවන අධ්‍යක්ෂවරයකු ලෙස පත් කිරීමත් සමඟ මෙම තත්ත්වය නිවැරදි විය. 2020 ජූලි මාසයේ සිට අපගේ මව් සමාගම වන ලංකා බැංකුව හරහා මුදල් අමාත්‍යාංශයට කරන ලද බොහෝ ඉල්ලීම්වල ප්‍රතිඵලයක් ලෙස වරුණ ජයසිංහ මහතාගේ ස්වාධීන අධ්‍යක්ෂවරයෙකු ලෙස නාමයෝජනා ලබා ගැනීමට හැකි විය.<br>**වගකිවයුතු නිලධාරියා** -සමාගම් ලේකම්<br>**2022.12.31 දිනට තත්වය** –<br>නිවැරදි කර ඇත.<br>**කාල නියමය -**<br>සම්පූර්ණයි. | උපුටා දක්වන ලද මගපෙන්වීම් අනුව අදාළ අනුකූලතා සපුරා ඇති බව සහතික කිරීමට නිර්දේශ කරනු ලැබේ. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. මිලියන 529ක ලාභයක් වූ අතර පූර්ව වර්ෂයේ එයට අනුරූප අලාභය රු. මිලියන 1,108ක් විය. එබැවින් මූල්‍ය ප්‍රතිඵලයේ රු. මිලියන 1,637ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ප්‍රධානම හේතු වන්නේ අදාළ වර්ෂය හා සසඳන විට සමාලෝචිත වර්ෂයේ ශුද්ධ පොළී ආදායම රු. මිලියන 1.432කින් වැඩිවීම**,** ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ ගාස්තු රු. මිලියන 488කින් අඩුවීමයි.

## 2.2 ප්‍රධාන ආදායම් හා වියදම් අයිතමයන්ගේ ප්‍රවනතා විශ්ලේෂණය

සමාලෝචිත වර්ෂයේ ප්‍රධාන ආදායම් සහ වියදම් අයිතම පූර්ව වර්ෂය හා සැසඳීමේ දී වැඩිවීමේ හෝ අඩුවීමේ ප්‍රතිශතය පහත දක්වා ඇත.

| විස්තරය | 2021 (රු. '000) | 2020 (රු.'000) | වෙනස (%) | විචලනයට හේතුව |
|---|---|---|---|---|
| පොළිය සහ සමාන ආදායම | 5,525,955 | 4,950,638 | 11.62 | පසුගිය වර්ෂය හා සැසඳීමේ දී, සමාලෝචිත වර්ෂයේ ණය සහ ලැබිය යුතු මුදල් වැඩිවීම පොළී ආදායම වැඩි වීමට ප්‍රධාන වශයෙන් හේතු වී ඇත. සමාලෝචිත වර්ෂය සඳහා දළ ණය සහ අත්තිකාරම් පසුගිය වර්ෂය හා සැසඳීමේ දී, රු. මිලියන 701 කින් හෝ සියයට 15කින් වැඩි වී ඇත. |
| පොළිය සහ සමාන වියදම | 2,675,588 | 3,532,790 | (24.26) | තැන්පතු පදනම සහ සමාගමේ ණය ගැනීම් අඩුවීම හේතුවෙන් පොළී වියදම අඩු වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ සමාගමේ තැන්පතු පදනම පූර්ව වර්ෂය හා සැසඳීමේ දී, රු. මිලියන 528 කින් හෝ සියයට 21 කින් අඩු වී ඇත. සමාලෝචිත වර්ෂය තුළ ණය ගැනීම් ද පූර්ව වර්ෂය හා සැසඳීමේ දී, රු. මිලියන 310 කින් හෝ සියයට 54 කින් අඩු වී තිබුණි. |
| ගාස්තුව සහ කොමිස් ආදායම | 185,602 | 116,893 | 58.78 | ගාස්තු හා කොමිස් ආදායම ප්‍රධාන වශයෙන් පෙර වසර හා සසඳන විට සමාලෝචිත වසර තුළ වෙළෙඳාම හා ඒ වෙනත් ආශ්‍රිත ක්‍රියාකාරකම් ඉහළ යාම හේතුවෙන් ඉහළ ගොස් තිබුණි. පූර්ව වර්ෂය හා සසඳන විට වෙළෙඳාම සහ වෙනත් ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අදාළ ආදායම රු. මිලියන 69 කින් හෝ සියයට 59 කින් ඉහළ ගොස් තිබුණි. |
| ශුද්ධ වෙළෙඳ ආදායම | 44,281 | 10,312 | 329.4 | වෙළෙඳ ක්‍රියාකාරකම්වලින් පැන නගින ප්‍රතිඵලය තුළ, ලාභයක් හෝ අලාභයක් සහිතව සාධාරණ වටිනාකමින් මූල්‍ය වත්කම් බැහැර කිරීමේ ආදායම ඇතුළත් වේ. මූල්‍ය වත්කම් බැහැර කිරීම සම්බන්ධ ආදායම පෙර වසර හා සසඳන විට, රු. මිලියන 34 කින් හෝ සියයට 329 කින් ඉහළ ගොස් තිබුණි. |
| වෙනත් මෙහෙයුම් ආදායම | 238,662 | 46,541 | 412.80 | වෙනත් මෙහෙයුම් ආදායමේ වර්ධනයට පූර්ව වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂය තුළ දේපල හා උපකරණ බැහැර කිරීම් ලැබීම්, ලාභාංශ ආදායම, නිශ්චල දේපල ලාභ සහ අලාභ, ආයෝජන දේපලවලින් ලාභ හා අලාභ සහ කපා හැරීම් එකතුකිරීම් රු. මිලියන 192 කින් ඉහළ යාම හේතු වී තිබුණි. |

| | | | | |
|---|---|---|---|---|
| ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් | 74,450 | 563,431 | (86.79) | පූර්ව වර්ෂය හා සැසඳීමේදී, සමාලෝචිත වර්ෂයේ ණය සහ අනෙකුත් අලාභ සඳහා හානිකරණ අයකිරීම් රු. මිලියන 489 කින් අඩුවීම කෙරෙහි, පුද්ගල සැලකිය යුතු ණය සඳහා වූ හානිකරණය රු. මිලියන 437 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි. |

### 2.3 අනුපාත විශ්ලේෂණය

ලබා දී ඇති තොරතුරුවලට අනුව, සමාලෝචිත වර්ෂය සහ පූර්ව වර්ෂය සඳහා සමාගමේ ඇතැම් වැදගත් අනුපාත පහත දක්වා ඇත.

| විස්තරය | ආංශික අනුපාතය | සමාගම | |
|---|---|---|---|
| | | 2021 | 2020 |
| කාර්යසාධන අනුපාත | | | |
| හිමිකම් මත ප්‍රතිලාභ (ROE) | 10.9 | 18.77 | (54.39) |
| වත්කම් මත ප්‍රතිලාභ (ROA) | 1.0 | 1.59 | (3.20) |
| පොළී ආන්තිකය | 3.1 | 9.42 | 4.50 |
| වත්කම් තත්ත්ව අනුපාතය | | | |
| දළ අක්‍රිය අත්තිකාරම් (NPL) | 4.7 | 15.92 | 17.86 |
| ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අනුපාත | | | |
| ස්ථර 1 ප්‍රාග්ධනය (අවම 7%) | | 10.75 | 4.41 |
| මුළු ප්‍රාග්ධනය (අවම 11.0%) | | 11.33 | 5.59 |
| ව්‍යවස්ථාපිත අනුපාතය | | | |
| ද්‍රවශීල වත්කම් අනුපාතය | | 12.92 | 8.17 |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 හඳුනාගත් පාඩු

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දීර්ඝ කාලයක් පොදු ලෙජරයෙහි පවතින බැර ශේෂයන්ගේ එකතුව රු.21,786,874ක් ලියා හැරීමට සහ දීර්ඝ කාලයක් පොදු ලෙජරයෙහි පවතින හර ශේෂයන්ගේ එකතුව රු.42,479,910ක් ලියා හැරීමට අනුමත කරන ලදී. | දීර්ඝ කාලීන හිඟ ශේෂයන් ලියා හැරීම නිශ්කාෂණය සඳහා වූ වෙහෙසකර සැසඳීමේ ක්‍රියාවලියක් සම්පූර්ණ කිරීම මගින් සිදුකරන ලදී. රු.21,786,874ක ලියා හැරීමේ ශේෂය රු.42,479,910ක ආපසු ලිවීමේ ශේෂය සමඟ හිලව් වන බැවින් පාඩුවක් සිදු නොවිය. අධ්‍යක්ෂ මණ්ඩලයේ විගණන කමිටුවේ නිර්දේශ සහිතව අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ප්‍රතිපත්තියට අනුව මණ්ඩලයේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු මෙම | ලියා හැරීම හේතුවෙන් සමාගමට සිදුවිය හැකි පාඩුව අවම කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| | | ශේෂයන් ලියා හරින ලදී.<br>**වගකිවයුතු නිලධාරියා** මූල්‍ය අංශයේ ප්‍රධානියා.<br>**2022.12.31 දිනට තත්ත්වය -**<br>කළමනාකාරිත්වයේ අදහසට අනුව නිර්දේශය දැනටමත් අනුගමනය කරමින් පවතී.<br>**කාල නියමය -** ඉදිරියට පවතී. | |
| ආ | සමාගම විසින් සමාලෝචිත වර්ෂය තුළදී, ආපසු අයකර ගැනීමට නොහැකිවීම මත අක්‍රිය ණය සහ අත්තිකාරම් රු.47,777,741 ක් දක්වා ලියා හැර තිබුණි. | නැවත අයකර ගැනීම සඳහා කළ හැකි සියලු ක්‍රියාමාර්ග සලකා බැලීමෙන් අනතුරුව, අවසාන විකල්පය ලෙස ලියා හැරීමේ යෝජනාව අනුමැතිය සඳහා මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ. සෑම ලියා හැරීමක් සඳහාම සාධාරණීකරණය කරමින් විස්තරාත්මක පත්‍රිකාවක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.<br>**වගකිවයුතු නිලධාරියා** -ප්‍රතිසාධන අංශ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –**<br>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.<br><br>**කාල නියමය -** ඉදිරියට පවතී. | ණය ලියා හැරීමට ප්‍රථම ආපසු අයකර ගැනීමට හැකි සෑම ප්‍රයත්නයක්ම ගැනීමට නිර්දේශ කෙරේ. |
| ඇ | Whistle Blowing වාර්තාකරණ පද්ධතිය හරහා වාර්තාවන එම සමාගමේ චෝදනා සම්බන්ධයෙන් පුද්ගලික විගණන ආයතනයක් චෝහාරික විගණනයක් සිදුකර තිබුණි. චෝහාරික විගණන වාර්තාව 2021 වර්ෂයේ දී නිකුත් කර ඇති අතර, එම වාර්තාව හරහා අනාවරණය වූ ප්‍රධාන චෝදනා මෙම වාර්තාවේ ***ඇමුණුම I හි*** සාරාංශගතව දක්වා ඇත. | වර්තමාන තත්ත්වය ඇමුණුම I යටතේ යාවත්කාලීන කර ඇත.<br>**2022.12.31 දිනට තත්ත්වය –**<br>තත්ත්වය සහ කාල නියමය සඳහා කරුණාකර ඇමුණුම 1 බලන්න. | වරදකරුවන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ අනාගතයේදී එවැනි චෝදනා වළක්වා ගැනීම සඳහා සමාගමේ අභ්‍යන්තර පාලන රාමුව ශක්තිමත් කිරීමත් නිර්දේශ කෙරේ. |
| ඈ | සමාගම විසින් 2020 නොවැම්බර් මස 03 වන දින ලබා දුන් අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පදනම්ව 2021 නොවැම්බර් 30 වන දින අනාරක්ෂිත වාණිජ පත්‍රිකාවල කරන ලද රු.107,777,000ක ආයෝජනය සම්බන්ධ දිගුකාලීන ආපසු අයකර ගත නොහැකි ශේෂයන් ලියා හැර තිබුණි. එම්බීඑස්එල් සමඟ ඒකාබද්ධ වීමට පෙර, 2008 දී එම්බීඑස්එල් ඉතිරිකිරීමේ බැංකුව විසින් ආයේජනය කර ඇති අතර මේ සම්බන්ධයෙන් දැනටමත් ප්‍රතිපාදන සලසා ඇත. | ලියා හැරීමේ යෝජනාව ඉදිරිපත් කරනු ලබන්නේ සියලු නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසුව, වැඩිදුර ක්‍රියාමාර්ග ගත නොහැකිවීමෙන් පසුය.<br>**වගකිවයුතු නිලධාරියා** ප්‍රතිසාධන ප්‍රධානියා / නීති ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –**<br>කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.<br><br>**කාල නියමය -** ඉදිරියට පවතී | සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. |

## 3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | සමාගම විසින් 2021 වර්ෂය තුළ වාහන 296ක් නැවත ලබාගෙන අලෙවි කර තිබුණි. කෙසේ වෙතත් වාහන 296කින් වාහන 138ක් තක්සේරු වාර්තාවේ සඳහන් අපේක්ෂිත විකුණුම් වටිනාකමට වඩා අඩු මිලකට අලෙවි කර තිබුණි. මෙහි සමස්ත බලපෑම රු.30,004,060 (තක්සේරු වාර්තාව සහ බැහැර කිරීමේ වටිනාකම අතර වටිනාකමෙහි වෙනස) කි. තවද එම ඉවත් කරන ලද වාහන සඳහා කිසිදු ඉහළ මිලක් නියම කර නොතිබුණි. මෙම වාර්තාවෙහි ඇමුණුම II බලන්න. | සියලුම වාහන බැහැර කිරීම් සමාගමේ බැහැර කිරීමේ කමිටුව විසින් අනුමත කරනු ලැබේ. වාහන බැහැර කිරීම අනුමත කිරීමේදී, කමිටුව විසින් වාහන තක්සේරුවෙන් 80% ට වැඩි සියලුම වාහන සලකා බලනු ලැබේ. ඇතැම් අවස්ථාවලදී, 80% ට අඩු සමහර ව්‍යතිරේක කමිටුව විසින් අනුමත කරනු ලැබේ. නවතම තක්සේරුවෙන් (මාස 6ක් ඇතුළත) 80%කට වැඩි වාහන බැහැර කිරීමේදී පහත සඳහන් කරුණු සලකා බලනු ලැබේ.<br><br>**වගකිවයුතු නිලධාරියා** ප්‍රතිසාධන අංශ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය** – කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.<br><br>**කාල නියමය -** ඉදිරියට පවතී | සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. |
| (ii) | 2021 වර්ෂය තුළ අංගනයේ පැවති වාහන බැහැර කිරීම සම්බන්ධයෙන් පවත්නා තොරතුරුවලට අනුව, අංගනයේ පැවති වාහන 296ක් බැහැර කර තිබුණි. මෙම වාහන අතර වාහන 274ක් ඉවත් කර ඇත්තේ එම වාහනවලින් අයකරගත යුතු සම්පූර්ණ හිඟ වටිනාකමට වඩා අඩුවෙනි. එම වාහන සඳහා අයකර ගැනීමට නියමිත සම්පූර්ණ හිඟ මුදල රු.794,099,816ක් වූ අතර සමස්ත බැහැර කළ වටිනාකම රු.352,612,690ක් විය. එබැවින් අංගනයේ පැවති වාහන බැහැර කිරීමෙන් රු. 441,487,125ක අලාභයක් සිදුව තිබුණි. මෙම වාර්තාවෙහි ඇමුණුම III බලන්න. | ඉහත 3.2 (11) වගන්තිය යටතේ විස්තර කර ඇති පරිදි බැහැර කිරීමේ තීරණය ඉවත් කිරීමේ කමිටුව විසින් ගනු ලැබේ. බැහැර කිරීමේ කමිටුව තීරණ ගැනීමේදී සෑම විටම සමාගමට සිදුවිය හැකි පාඩු අවම කිරීමට වග බලා ගත යුතු වේ. එසේම වාහනය බැහැර කිරීමෙන් අනතුරුව සහ සමාගමේ පොත්වල බැහැර කිරීමේ අලාභයක් සටහන් වූ සෑම අවස්ථාවකම ණය ගැනුම්කරුට සහ ඇපකරුවන්ට බැහැර කිරීමේ අලාභය සඳහා නීතිමය ක්‍රියාමාර්ග ආරම්භ කරනු ලැබේ.<br><br>**වගකිවයුතු නිලධාරියා** ප්‍රතිසාධන අංශ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය** – කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.<br><br>**කාල නියමය -** ඉදිරියට පවතී. | සමාගමට සිදුවිය හැකි පාඩු අවම වන පරිදි විචක්ෂණශීලීව තීරණ ගැනීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (iii) | රඳවාගත් වාහන අංගණයෙන් බැහැර කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් නිරීක්ෂණය විය. වාහන 93කින් වාහන 85ක් 2022 ඔක්තෝබර් 07 වන දිනවන විටත් (වසරකට වැඩි) දීර්ඝ කාලයක් අංගනයෙහි රඳවා තිබුණි. එය වසර ගණනාවක් පුරා අධික නඩත්තු පිරිවැයක් දැරීමටත්, වාහනවල වටිනාකම අඩුවීමෙන් පාඩු සිදුවීමටත් හේතුවිය. | මෙයට ප්‍රධාන වශයෙන් හේතු වූයේ පෙර ටෙන්ඩරයේ සඳහන් මිල පිළිගත හැකි මට්ටමේ නොතිබීමය. කෙසේ වෙතත්, සැලකිය යුතු අලාභයක් සිදු නොවන අවස්ථාවල ප්‍රමාදයකින් තොරව වාහන බැහැර කිරීමට කටයුතු කරනු ලැබේ.<br><br>**වගකිවයුතු නිලධාරියා** ප්‍රතිසාධන අංශ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –** කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.<br><br>**කාල නියමය - ඉදිරියට පවතී** | රඳවාගත් වාහන බැහැර කිරීමේදී සැලකිය යුතු ප්‍රමාදයන් වළක්වා ගැනීමට නිර්දේශ කරනු ලැබේ. |
| (iv) | වාහන බැහැර කිරීම සඳහා පැවැති වෙන්දේසිවල විනිවිදභාවයක් නොමැති බව නිරීක්ෂණය විය. 2021 වර්ෂය තුළ ඉවත් කරන ලද වාහන 296කින් වාහන 72ක් දෙවන ලංසුකරු විසින් රු.111,574,000ක මුදලකට මිල දී ගෙන තිබුණි. ලංසුකරුවන් තමන් විසින්ම ඉදිරිපත් කරන ලද අර්පණයන් ඉවත් කර ගනු ලැබුවේද සමාගමේ නිලධාරීන් විසින් ප්‍රතික්ෂේප කරනු ලැබුවේද යන්න තහවුරු කර ගැනීමට ඉහළ බලධාරීන් විසින් ද්විත්ව පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. | එතැන් සිට ද්විත්ව පාලන පද්ධතියක් ක්‍රියාත්මක කර ඇත. නවතම අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමත ක්‍රියාපටිපාටියට අනුව ඉවත්කිරීමේ කමිටුවේ සාමාජිකයින් දෙදෙනෙකු විසින් මුදල් ආපසු ගැනීම සත්‍යාපනය කර ලේඛනය අත්සන් කළ යුතුය.<br><br>**වගකිවයුතු නිලධාරියා -** ප්‍රතිසාධන අංශ ප්‍රධානියා.<br><br>**2022.12.31 දිනට තත්ත්වය –**නිවැරදි කර ඇත.<br><br>**කාල නියමය -** සම්පූර්ණයි. | වාහන වෙන්දේසි ක්‍රියාවලියේ විනිවිදභාවයක් ඇති කිරීමට නිර්දේශ කෙරේ. |

| | | | |
|---|---|---|---|
| (v) | අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විගණන කමිටුව, ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව, වේතන කමිටුව සහ අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව ලෙස අධ්‍යක්ෂ මණ්ඩල කමිටු හතරක් පිහිටුවා ඇත. එම කමිටුවල සියලුම වාර්තා සමාලෝචනය සඳහා ප්‍රධාන අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලැබේ.<br><br>කෙසේ වෙතත්, මානව සම්පත් සහ වේතන කමිටුවේ (HRRC) සහ අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුවේ (RPTRC) රැස්වීම් වාර්තා නියමිත වේලාවට අනුමත කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. | අතපසුවීමකින් 2021 වර්ෂය තුළ RPTRC සහ HRRC යන දෙඅංශයේම සමහර වාර්තා අනුමත කිරීම සඳහා නියමිත වේලාවට අධ්‍යක්ෂ මණ්ඩලය වෙත ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, මේ වන විට මෙය නිවැරදි කර ඇති අතර, මානව සම්පත් සහ වේතන කමිටුව (HRRC) සහ අදාළ පාර්ශ්ව ගනුදෙනු සමාලෝචන කමිටුව (RPTRC) යන දෙකෙහිම සියලුම වාර්තා අධ්‍යක්ෂ මණ්ඩලයට ඉදිරිපත් කර නිසි පරිදි සහතික කර ඇත. නිවැරදි කිරීමේ පියවරක් ලෙස, අප විසින් මේ වන විට අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් සඳහා මාර්ගෝපදේශයක් ලෙස ආදර්ශ න්‍යාය පත්‍රයක් භාවිතා කරන අතර, නියමිත මණ්ඩල රැස්වීමට නියමිත වාර්තා/ රැස්වීම් වාර්තා සියල්ල උඩුගත කර තිබේද යන්න සැමවිටම පරීක්ෂා කරනු ලැබේ.<br><br>**වගකිවයුතු නිලධාරියා - සමාගම් ලේකම්**<br>**2022.12.31 දිනට තත්ත්වය –**<br>නිවැරදි කර ඇත.<br><br>**කාල නියමය - සම්පූර්ණයි** | වඩා හොඳ පාලනයක් සඳහා සියලුම අනුකමිටු වාර්තා/වාර්තා මීළඟ ආසන්නතම අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කිරීමට නිර්දේශ කෙරේ. |
| (vi) | අභ්‍යන්තර විගණන අංශය විසින් ඔවුන්ගේ ශාඛා චාරිකාවලදී නිරීක්ෂණය කරන ලද ප්‍රධාන දුර්වලතා මෙම වාර්තාවේ ඇමුණුම IVහි සාරාංශගතව දක්වා ඇත. | විගණන නිරීක්ෂණ අධීක්ෂණය, පාලනය සහ විධිමත් කිරීම සඳහා ශාඛා මෙහෙයුම් ඒකකය ආයතන ව්‍යුහයට අලුතින් එක් කර ඇත.<br><br>**වගකිවයුතු නිලධාරියා -** ප්‍රධාන අභ්‍යන්තර විගණක<br>**2022.12.31 දිනට තත්ත්වය –** කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.<br>**කාල නියමය** - ඉදිරියට පවතී | හඳුනාගත් ගැටලු නිවැරදි කිරීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට නිර්දේශ කරනු ලැබේ. |

**3.3 නිශ්කාර්ය හෝ ඌන උපයෝජිත දේපල, පිරියත සහ උපකරණ**

| අංකය | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | ඉඩමේ නීත්‍යානුකූල අයිතිය සමාගමට හිමි වුවද, පෙර ඉඩම් හිමියන් සමඟ පවතින නීතිමය තත්ත්වයන් හේතුවෙන් ආයෝජන දේපල කිහිපයකට ප්‍රවේශවීම සීමා කර ඇත. එම නිසා ඉඩම් සහ ගොඩනැගිලි තවමත් කිසිදු ප්‍රයෝජනයක් නොමැතිව නිශ්කාර්යව පවතී. | ආයෝජන දේපල 07කි. ආරම්භයේ දී ආයෝජන දේපල පිළිබඳ නඩු විභාග 5ක් තිබුණි. නීතිමය නඩුව අවසන් කර ඇති බැවින් සහ එක් ආයෝජන දේපලක් සඳහා නෙරපා හැරීමේ ආඥාව ක්‍රියාත්මක කළ නොහැකි බැවින්, ආයෝජන දේපල පිළිබඳ නීතිමය නඩු 4ක් පමණක් ඉතිරිව පවතී. එකක් බදු දේපලක් වන අතර එක් දේපලක් සඳහා බැහැර කිරීමට අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී. | නීතිමය අවසරය ලබා ගැනීමෙන් පසු ආයෝජන දේපල ඵලදායී ආකාරයෙන් භාවිතා කිරීම නිර්දේශ කෙරේ. |

**වගකිවයුතු නිලධාරියා -** දේපළ වෙළඳාම් අංශ ප්‍රධානියා

**2022.12.31 දිනට තත්ත්වය –**

කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම්වල සඳහන් කර ඇති පරිදි නිර්දේශය දැනටමත් අනුකූල වේ.

**කාල නියමය -** ඉදිරියට පවතී.

## 3.4 මානව සම්පත් කළමනාකරණය

| අංක | විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (i) | 2021 මූල්‍ය වර්ෂය සඳහා සමාගමේ අනුමත සේවක සංඛ්‍යාව සේවක සංඛ්‍යාව 1,269ක් වූ අතර එදිනට විට සැබෑ සේවක සංඛ්‍යාව 972ක් විය. 2021 දෙසැම්බර් 31 වන විට රැකියා කාණ්ඩ 12ක තනතුරු 440ක සංඛ්‍යාවක් පුරප්පාඩු වී ඇති අතර, රැකියා කාණ්ඩ 4ක අතිරික්ත සේවකයින් 143ක සංඛ්‍යවක් පවතින බව නිරීක්ෂණය විය. තවදුරටත් බැංකුවෙහි ප්‍රධාන මූල්‍ය නිලධාරී තනතුර 2021 සිට පුරප්පාඩු වී පවතී. විස්තර පහත වගුවෙහි දැක්වේ. | අනාගත ව්‍යාපාර වර්ධනය කෙරෙහි අවධානය යොමු කරමින් සේවක සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා අනුමැතිය ලබා ගන්නා ලදී. කෙසේ වෙතත්, වත්මන් ආර්ථික සීමාවන් හේතුවෙන් සේවක සංඛ්‍යාව වැඩි කිරීම පිරිවැය කළමනාකරණය කිරීම සඳහා සලකා නොබලන ලදී. මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවක සංඛ්‍යාව තක්සේරුවක් ආරම්භ කර ඇති අතර එය 2022 දෙසැම්බර් 31 වන දිනට සම්පූර්ණ කර අධ්‍යක්ෂ මණ්ඩලය වෙත යාවත්කාලීන කරනු ඇත.<br><br>**වගකිවයුතු නිලධාරියා -** මානව සම්පත් ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –**<br><br>ක්‍රියාත්මක වෙමින් පවතී.<br><br>**කාල නියමය -** 31.03.2023 | බැංකුවේ කටයුතු සුමටව පවත්වාගෙනයාම සහතික කිරීම සඳහා පුරප්පාඩු වූ තනතුරු සඳහා සේවකයන් බඳවා ගැනීමට අවශ්‍ය පියවර ගැනීමට නිර්දේශ කෙරේ. |

| තනතුර | අනුමත සේවක සංඛ්‍යාව | 2021/12/31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|
| ප්‍රධාන විධායක නිලධාරී | 1 | 1 | - |
| ප්‍රධාන මූල්‍ය නිලධාරී | 1 | - | 1 |
| නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී | 6 | 1 | 5 |
| සහකාර සාමාන්‍යාධිකාරී | 13 | 10 | 3 |
| ප්‍රධාන කළමනාකරු/ ප්‍රාදේශීය කළමනාකරු | 16 | 11 | 5 |
| ජ්‍යෙෂ්ඨ කළමනාකරු | 24 | 15 | 9 |
| කළමනාකරු | 50 | 55 | (5) |
| නියෝජ්‍ය කළමනාකරු | 118 | 56 | 62 |
| සහකාර කළමනාකරු | 101 | 87 | 14 |
| විධායක නිලධාරී | 162 | 144 | 18 |
| කනිෂ්ඨ විධායක නිලධාරී | 75 | 211 | (136) |
| මාණ්ඩලික සහකාර | 487 | 347 | 140 |

| | | | |
|---|---|---|---|
| පුහුණු කාර්ය මණ්ඩ□ සහකාර | 3 | 4 | (1) |
| අලෙවි සහකාර | 127 | - | 127 |
| කාර්යාල සහයක | 72 | 17 | 55 |
| රියදුරන් | 9 | 10 | (1) |
| වෙනත් | 4 | 3 | 1 |
| සමස්ත | 1269 | 972 | 297 |

(ii) 2021 මුදල් වර්ෂය තුළ අභ්‍යන්තර විගණන අංශයේ පුරප්පාඩු පහක් (5) නිරීක්ෂණය විය. එම පුරප්පාඩු පිරවීම සඳහා අදාළ බලධාරීන් සතුටුදායක ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි. විස්තර පහත දක්වා ඇත.

| **තනතුර** | **අනුමත සේවක සංඛ්‍යාව** | **2021/12/31 දිනට සත්‍ය සේවක සංඛ්‍යාව** | **පුරප්පාඩු** |
|---|---|---|---|
| සහකාර සාමාන්‍යාධිකාරී | 1 | - | 1 |
| ප්‍රධාන කළමනාකරු/ ප්‍රාදේශීය කළමනාකරු | 1 | - | 1 |
| ජ්‍යෝෂ්ඨ කළමනාකරු | 2 | 2 | - |
| සහකාර කළමනාකරු | 1 | 1 | - |
| විධායක නිලධාරී | 4 | 4 | - |
| කනිෂ්ඨ විධායක නිලධාරි | 3 | 4 | (1) |
| මාණ්ඩලික සහකාර | 8 | 4 | 4 |
| සමස්ත | 20 | 15 | 5 |

වර්තමානයේ 2022 දී අභ්‍යන්තර විගණනය, කාර්ය මණ්ඩල සාමාජිකයින් 11 දෙනෙකු සමඟ ක්‍රියාත්මක වේ. මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ උපදෙස් යටතේ දැනට තවදුරටත් බඳවා ගැනීම් සීමා කර ඇත. වර්තමාන හිඟය ප්‍රධාන වශයෙන් කනිෂ්ඨ විධායක සහ මාණ්ඩලික සහකාර මට්ටමින් පවතී.

**වගකිවයුතු නිලධාරියා** ප්‍රධාන අභ්‍යන්තර විගණක

**2022.12.31 දිනට තත්ත්වය –**

ක්‍රියාත්මක වෙමින් පවතී

**කාල නියමය -** 2023.06.30

ප්‍රමුඛතා පදනම මත පුරප්පාඩු පිරවීමට අවශ්‍ය පියවර ගැනීම නිර්දේශ කෙරේ.

*ඇමුණුම I*

| ගැටළුව | ගැටළුව කෙටියෙන් | දැරිය හැකි අලාභය (Rs.) | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| **ඉඩම්** | | | |
| වත්තල ඉඩම විකිණීම | සාවද්‍ය තක්සේරු වාර්තාවක් පදනම් කරගෙනය වත්තල වාහන අංගණ පරිශ්‍රය විකුණා ඇත. මෙම ඉඩම වාණිජ ප්‍රදේශයක් තුළ පිහිටා තිබුණද එය නේවාසික ප්‍රදේශයක පිහිටා ඇති බව දක්වමින් එහි වටිනාකම තක්සේරු කර තිබුණි. මෙහි අත යට ගණුදෙණුවක් ඇති බව පෙනී යයි. | පර්චසයේ වටිනාකම රුපියල් 1,700,000 ත් 2,000,000 ත් අතර වන අතර ඉඩම පර්චසයක් රුපියල් 1,566,000 ක මිලකට විකුණා ඇත. | ප්‍රකාශිත ක්‍රියා පටිපාටි දෝෂ හැර, වාර්තාවේ සඳහන් මූල්‍ය බලපෑම පැහැදිලිව දක්වා ඇති අතර එය ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කර ඇත. ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කරන ලද චෝහාරික විගණන වාර්තාව මත පදනම්ව ඔවුන් පෙන්වා දී ඇත්තේ මහ බැංකුවේ පූර්ව අනුමැතියකින් තොරව ආයතනය විසින් එම දේපල වෙළඳපල වටිනාකමට වඩා අඩුවෙන් විකුණා ඇති බවයි. 2022 නොවැම්බර් 15 දිනැති ලිපිය මගින් මහ බැංකුව විසින් ආයතනය හට අනාගතයේදී එවැනි උල්ලංඝනයන් නැවත සිදු නොකරන ලෙස දැඩි ලෙස උපදෙස් දී ඇත.<br>**වගකිවයුතු නිලධාරියා - දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා**<br>**2022.12.31 දිනට තත්ත්වය –** කළමනාකාරීත්වයේ අදහස් දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුවේ නිර්දේශ අනුගමනය කරනු ලැබේ.<br><br>**කාල නියමය -** ඉදිරියට පවතී. |
| කුරන ඉඩම විකිණීම | කුරණ පර්චස් 23 ඉඩම නව වටිනාකම නොසලකා අත්පත් කරගත් මුදලටම විකිණීමට යන බව නිරීක්ෂණය විට. කෙසේ වෙතත් අත්තිකාරම් ගෙවා මෙම ඉඩම වෙන්කර ගත්තද එය විකුණා නොමැත. | - | පෙන්වා දෙන ලද ක්‍රියා පටිපාටියේ අඩුපාඩු 2022.06.30 වන විට නිවැරදි කර ඇත.<br>**වගකිවයුතු නිලධාරියා - දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා**<br><br>**2022.12.31 දිනට තත්ත්වය –** නිවැරදි කර ඇත.<br>**කාල නියමය - සම්පූර්ණයි.** |
| හෝකන්දර කලල්ගොඩ ඉඩම විකිණීම. | හෝකන්දර ප්‍රදේශයේ අක්කර 16ක පමණ ඉඩමක් නව මිලට තක්සේරු නොකර විකුණා ඇත. එම ප්‍රදේශයේ අලෙවි කරන | - | ඊ ඇන්ඩ් වයි විගණකවරුන් විසින් චෝහාරික විගණන වාර්තාවේ කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු සටහන් කර නොමැත. |

| | | | |
|---|---|---|---|
| | අවස්ථාවේ මිල රුපියල් 1,000,000 කට වඩා වැඩි වූ අතර ඉතා අඩු මිලක් මත විකිණීම සඳහා අත්තිකාරම් මුදලක් ලබාගෙන ඇත. | | වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |
| ඒකල ඉඩම විකිණීම | 2018 දෙසැම්බර් 12 දින, තවත් ස්වාධීන තක්සේරුවකට යටත්ව වැඩිම ලංසුකරුට දේපළ රුපියල් 136,698,000කට විකිණීමට මණ්ඩලය අනුමත කර ඇති අතර වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියා 2019 ජුලි 8 වන දින එම දේපල වෙනත් අයෙකුට රුපියල් 123,000,000 ක් වූ අඩු අගයකට විකිණීමට මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන ඇත. | නව මිල කලින් එකඟ වූ මිලට වඩා රුපියල් 13,698,000 කින් අඩුය. | ඊ ඇන්ඩ් වයි විගණකවරුන් විසින් වෝහාරික විගණන වාර්තාවේ කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු සටහන් කර නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |
| කොට්ටාව ඉඩම මිලදී ගැනීම | 2018 වර්ෂය තුළදී මෙම ඉඩම පර්චසයක් රුපියල් 420,000 කට මිලදී ගැනීමට යෝජනා කර ඇත. කෙසේ වෙතත්, එය ප්‍රතික්ෂේප වූ අතර පසුව එම ඉඩම 2019 සැප්තැම්බර් මාසයේදී පර්චසයක් රුපියල් 485,000 ක මිලකට මිලදී ගන්නා ලදී. | රු.14,400,000 | ඊ ඇන්ඩ් වයි විගණකවරුන් විසින් වෝහාරික විගණන වාර්තාවේ කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු සටහන් කර නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |
| කොට්ටාව ඉඩම විකිණීම | සිදු කරන ලද තක්සේරුවට අනුව, ඉඩම විකිණිය හැකි දළ විකුණුම් වටිනාකම රුපියල් 261,500,000 ක් වූ අතර නිශ්චල දේපල ව්‍යාපෘතියේ සම්පූර්ණ විකුණුම් වටිනාකම රු. 204,366,250 ක් විය. | තක්සේරු මුදලට වඩා රු.57,133,750 අඩුයි. | ඊ ඇන්ඩ් වයි විගණකවරුන් විසින් වෝහාරික විගණන වාර්තාවේ කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු සටහන් කර නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |

| | | | |
|---|---|---|---|
| මඩම්පල්ල ඉඩම මිලදී ගැනීම | මාදම්මපල්ලේ පිහිටි පර්චසයක් රුපියල් 60,000 සිට 85,000 දක්වා මිලකට මිලදී ගැනීමට හැකිව තිබූ හිමිකම් ගැටළු සහිත අක්කර 6ක ඉඩමක් රුපියල් 110,075,000කට (පර්චසයක් රුපියල් 115,625) 2019 ජුලි 08 වැනි දින මිලදී ගෙන තිබුණි. පසුව ඉඩම් මිල පර්චසයක් රුපියල් 180,000 ක් ලෙස නියම කර ඇති අතර එය වෙළඳපල වටිනාකමට වඩා සාපේක්ෂව වැඩි බැවින් ආයතනය විසින් නියම කරන ලද මිල ගණන් යටතේ ඉඩම් කැබලි කිසිවක් විකුණාගත නොහැකි විය. 2021 අගෝස්තු 31 දින දක්වා ව්‍යාපෘතිය සඳහා දරන ලද රු. 24,169,012.84 ක් වූ මුළු පිරිවැය තවමත් අයකරගෙන නොමැත. | රු.24,169,012.84 | ඊ් ඇන්ඩ් වයි විගණකවරුන් විසින් වෝහාරික විගණන වාර්තාවේ කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු සටහන් කර නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** දේපළ වෙළඳාම් අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |
| **ණය** | | | |
| ඒපීජ් ජුවලරි (පුද්ගලික) සමාගම ලබා දී ඇති රුපියල් මිලියන 210 ක ණය | රුපියල් මිලියන 300 ක් වටිනා සී ස්ට්‍රීට් හි පිහිටි මහල් 6 කින් යුත් ගොඩනැගිල්ලක් සඳහා 2019 ජූලි 11 වැනි දින නුසුදුසු තක්සේරුවක් ලබා දී ඇත. මහල් 4ක ගොඩනැගිල්ලක් සඳහා පමණක් මුල් ගොඩනැගිලි අනුමැතිය ලබා ගත හැකි අතර මහල් 6ම වර්ග අඩි සලකා බලා තක්සේරු වාර්තාව ලබා දී ඇති අතර අවස්ථා දෙකකදී තක්සේරු වාර්තා දෙකක් නිකුත් කර ඇත. පළමු තක්සේරු වාර්තාව තට්ටු 6 කින් සමන්විත ගොඩනැගිල්ලක් සඳහා වර්ග අඩියකට රු.325 බැගින් ලබා දී ඇති අතර දෙවන තක්සේරුව තට්ටු 6 කින් යුත් ගොඩනැගිල්ලක් සඳහා වර්ග අඩියකට රු.390 බැගින් ලබා දී ඇත. තවද මෙම අගය වැඩිවීම සඳහා කිසිදු සාධාරණීකරණයක් ලේඛනගත නොවේ. ණය ගැණුම්කරු සංක්‍රමණය වීම නිසා ණය පැහැර හැරීම සිදු වී ඇත. | - | වෝහාරික විගණන වාර්තාවේ නිශ්චිත සාක්ෂි, අක්‍රමිකතා හෝ අඩුපාඩු හඳුනාගෙන නොමැත.<br>**වගකිවයුතු නිලධාරියා -** මධ්‍යම ණය අංශයේ ප්‍රධානියා<br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |

| | | | |
|---|---|---|---|
| ආයතනික අවදානම් කළමනාකරණ උපදේශක (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇති රුපියල් මිලියන 200 ක ණය මුදල | බැංකුව විසින් නිකුත් කරන ලද අවදානම් විශ්ලේෂණ වාර්තාවේ සඳහන් කර ඇත්තේ මෙම ආයතනය ඉතා දේශපාලනීකරණය වූ සංවිධානයක් වන අතර මුදල් විශුද්ධිකරණයට එරෙහි අවදානමක් පවතින බවයි. 2020 ජනවාරි මාසයේ දී පහසුකම් ගෙවීම හිඟව පැවති අතර එය 2020 මාර්තු දක්වා අඛණ්ඩව වැඩි විය. ණය ගැනුම්කරුගේ ඉල්ලීම පරිදි 2020 අප්‍රේල් මාසයේ සිට ණය සහන ලබා දී ඇත. | මාසිකව රු. මිලියන 3.06 ක පාඩුවක් | වෝහාරික විගණන වාර්තාවේ නිශ්චිත සාක්ෂි, අක්‍රමිකතා හෝ අඩුපාඩු හඳුනාගෙන නොමැත.<br>**වගකිවයුතු නිලධාරියා -** මධ්‍යම ණය අංශයේ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |
| ඩයනා වොකලට් (පුද්ගලික) සමාගම වෙත ලබා දී ඇති රුපියල් මිලියන 150 ක ණය මුදල | ඩයනා වොකලට් (පුද්ගලික) සමාගම වෙත වෙනම ණය වශයෙන් අදියර දෙකකින් මිලියන 250ක කාලීන ණය මුදලක් ලබා දීමට අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය හිමි විය. හැටන් නැෂනල් බැංකුවෙන් ලබාගෙන ඇති රුපියල් මිලියන 47.5 ක ණය පියවීම සඳහා 2019 ජුනි 26 වන දින පළමු රු. මිලියන 150 ලබා දෙන ලදී. 2019 ජූලි 2 වන දින නියමිත ගාස්තු අඩු කිරීමෙන් පසු ඉතිරි මුදල නිකුත් කරන ලදී. මණ්ඩලය විසින් අනුමත කරන ලද කොන්දේසියක් වන හැටන් නැෂනල් බැංකුවේ ණය පියවීම හැර තුන්වන පාර්ශ්ව ණය පියවීම සඳහා ණය ගැනුම්කරු විසින් ලබාගත් ණය මුදල් භාවිතා කර ඇති බවට ඔප්පු කිරීමට සාක්ෂි නොමැත. 2019 සැප්තැම්බර් මාසයේ දී පහසුකම් ගෙවීම හිඟව පැවති අතර එය 2020 මාර්තු දක්වා අඛණ්ඩව වැඩි විය. ණය ගැනුම්කරුගේ ඉල්ලීම පරිදි 2020 අප්‍රේල් මාසයේ සිට ණය සහන ලබා දී ඇත. | - | වෝහාරික විගණන වාර්තාවේ නිශ්චිත සාක්ෂි, අක්‍රමිකතා හෝ අඩුපාඩු හඳුනාගෙන නොමැත.<br>**වගකිවයුතු නිලධාරියා -** මධ්‍යම ණය අංශයේ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ. |
| අජන්තා රණවක මහතාට වෙත ලබා දී ඇති රු.800,000 පුද්ගලික ණය | මෙම ගනුදෙනුකරු 2012 දෙසැම්බර් 18 දින ණය අංකය 6482347 යටතේ සියයට 18 ක පොලී අනුපාතයකට, මාස 60 ක කාලයක් රු. 800,000 පුද්ගලික ණය මුදලක් ලබා ගන්නා ලදී. අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත | - | හිඟ ණය මුදල් අයකර ගැනීමට කටයුතු ආරම්භ කර ඇති අතර 2022.12.31 වන විට හිඟ මුදල් පියවීමට ඔහුට ගෙවීමේ සැලැස්මක් ඉදිරිපත් ඇත.<br>**වගකිවයුතු නිලධාරියා -** අයකිරීම් අංශයේ ප්‍රධානියා |

| | | | |
|---|---|---|---|
| | පුද්ගලික ණය ප්‍රතිපත්තියට අනුව, ණයෙහි උපරිම කාලය මාස 48ක් වන අතර වාරිකය සෘජුවම බැංකුව වෙත ප්‍රේෂණය කිරීම සඳහා සේවායෝජකයාගෙන් වගකීම භාර ගැනීමේ ලිපියක් ලබා ගත යුතු අතර මෙම ණය පහසුකම එකී කොන්දේසිවලට අනුකූල නොවීය. මෙම ණය ලබා දීම සඳහා වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියාගේ අනුමැතිය ලබා ගනී. දැනට මෙම පහසුකම අක්‍රීය ණය කාණ්ඩයේ පවතී. | | **2022.12.31 දිනට තත්ත්වය –**<br>සිදු වෙමින් පවතී<br>**කාල නියමය-** 2023.03.01 |
| **වාහන නැවත අත්පත් කර ගැනීම** | | | |
| අත්පත් කර ගැනීමේ ගාස්තු වැඩිපුර ගෙවීම | අ. KU 1666 දරන වාහනය කිලෝමීටර 8.9ක් ඇතුළත නැවත අත්පත් කරගෙන තිබූ අතර අනුමත ගාස්තුව අනුව ගෙවිය හැක්කේ රුපියල් 23,000ක් පමණි. සාධාරණීකරණය කළ නොහැකි හේතු සපයමින් රුපියල් 145,000ක් ගෙවා තිබුණි.<br>ආ. SG LG 4356 දරන වාහනය කිලෝමීටර් 72ක් ඇතුළත අත්පත් කරගෙන තිබූ අතර අනුමත ගාස්තුව අනුව රු. 35,000ක් ගෙවිමට තිබූ අතර රු.176,000ක් ගෙවා තිබුණි.<br>ඇ. KF 2345 දරන වාහනය රු.125,000 ක් වැය කොට අත්පත් කරගෙන තිබූ අතර අනුමත ගාස්තුව අනුව රු. 35,000ක් පමණි.<br>ඇ. එන්සී කේජී 7036 දරන වාහනය රු.180,000 ක් වැය කොට අත්පත් කරගෙන තිබූ අතර අනුමත ගාස්තුව අනුව රු. 23,000ක් පමණි.<br>ඉ. එන්සී පීඩී 3095 දරන වාහනය රු.115,000 ක් වැය කොට අත්පත් කරගෙන තිබූ අතර අනුමත ගාස්තුව අනුව රු. 23,000ක් පමණි. | රු.742,000 | මෙම චෝදනාව වෝහාරික විගණන වාර්තාව මගින් තහවුරු නොකළ බවට වාර්තා විය. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** අයකිරීම් අංශයේ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –**<br>වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ |

| | | | |
|---|---|---|---|
| | ඊ. 54-9493 දරන වාහනය රු.175,000 ක් වැය කොට අත්පත් කරගෙන තිබූ අතර අනුමත ගාස්තුව අනුව රු. 35,000ක් පමණි. | | |
| 2020 මාර්තු 3 වැනි දින ඇන්ටන් ලාල් රුද්‍රිගු මහතාගෙන් නීතිඥවරයකු මාර්ගයෙන් ලද ඉල්ලීම් ලිපිය. | NW GU 8553 දරන වාහනය සඳහා ගනුදෙනුකරු රු. 2,410,000ක කල්බදු පහසුකමක් ලබාගෙන ඇත. 2020 පෙබරවාරි 25 වන දින ගනුදෙනුකරු විසින් වාහනය ශාඛාවට භාර දෙනු ලැබේ. ප්‍රේමරත්න ඇසෝසියේට්ස් වෙතින් 2020 ඔක්තෝබර් 23 දින තක්සේරුවක් ලබාගෙන ඇති අතර ලබා දී ඇති බලහත්කාර විකුණුම් වටිනාකම රු. 2,950,000 ක් ලෙස තක්සේරු කර ඇත. මෙම වාහනය 2021 අගෝස්තු 12 වන දින ටෙන්ඩර් ක්‍රියාවලියෙන් පිටත ලැබුණු රු. 2,415,000ක ලංසුවකට විකුණා ඇති අතර එය තක්සේරු වාර්තාවේ වටිනාකමට වඩා අඩු අගයක් වේ. | රු..535,000 | වෝහාරික විගණන වාර්තාවෙන් කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු හඳුනාගෙන නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br><br>**වගකිවයුතු නිලධාරියා** - අයකිරීම් අංශයේ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ |
| **අංගන මෙහෙයුම්** | | | |
| අංගන මෙහෙයුම් සම්බන්ධයෙන් ලැබුණු නිර්නාමික චෝදනා<br>. | අ. එන්ඩී- 8246 දරන බස් රථය අඩු මිලට ඔහුගේ පෞද්ගලික ලේකම්වරයාට විකුණා ඇති අතර වාහනයේ මිලට වඩා වැඩි වටිනාකමකට ලීසිං පහසුකම ලබා දී ඇත.<br><br>ආ. 2020 ජුනි 22 දින සීපී කේ්ර් 7174 දරන වාහනය බැහැර කිරීමේ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමෙන් පසු ලද රු. 1,737,000ක ලංසුවක් මත විකුණන ලදී. 2019 ඔක්තෝබර් 31 දිනැති තක්සේරු වාර්තාවට අනුව වෙළඳපල වටිනාකම රු. 2,450,000 ක් වන අතර බලහත්කාරයෙන් විකිණීමේ වටිනාකම රු. 2,400,000ක් වේ.<br><br>ඇ.තිස්සමහාරාම ශාඛාවේ කළමණාකරු තිස්සමහාරාම ප්‍රදේශයෙන් දිනකට වාහනයක් රුපියල් 60 බැගින් වාහන අංගනයක් ලබා ගැනීමට | - | වෝහාරික විගණන වාර්තාවෙන් කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු හඳුනාගෙන නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා** - අයකිරීම් අංශයේ ප්‍රධානියා<br><br>**2022.12.31 දිනට තත්ත්වය –** වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**කාල නියමය-** අදාල නොවේ<br>. |

| | | | |
|---|---|---|---|
| | අනුමැතිය ඉල්ලා සිටියේය. කොන්දේසි 3කට යටත්ව සහකාර මහා කළමණාකරු අයකිරීම් මෙම ඉල්ලීම නිර්දේශ කර තිබුණි. වැඩබලන ප්‍රධාන විධායක නිලධාරියා විසින් “අපි ගිවිසුමක් අත්සන් කරන්නේ නම් කරුණාකර අධ්‍යක්ෂ මණ්ඩල පත්‍රිකාවක් දමන්න” යනුවෙන් සටහනක් තබමින් ඉල්ලීම අනුමත කර ඇත. 2019 ඔක්තෝබර් 25 දිනට පෙර සිට ඉඩමක් අංගනයක් ලෙස ලබා ගැනීමේදී අනුගමනය කළ යුතු නිසි මාර්ගෝපදේශ සපයා නොතිබුණි. මණ්ඩලයේ අනුමත නියෝජිත අධිකාරියේ සීමාවන්ට අනුව අනෙකුත් වියදම් රු.100,001 සිට රු. 500,000 මිලදී ගැනීමේ කමිටුවේ නිර්දේශය මත ප්‍රධාන විධායක නිලධාරියා විසින් අනුමත කිරීමට අවසර ඇත. මිලදී ගැනීමේ කමිටුව නිර්දේශ කර ඇති බවට ඔප්පු කිරීමට ලේඛනගත සාක්ෂි නොමැති අතර ගිවිසුමක් අත්සන් කර නොමැත.<br><br>ඈ. 2018 වසරේ එවකට පැවති ඒකල අංගනය හෙයියන්තුඩුවේ අංගනයකට මාරු කිරීමේදී කිසිදු ගිවිසුමක් අත්සන් කර නොමැති අතර එය අංගනයක් ලෙස භාවිත කිරීමට ද හොඳ තත්ත්වයේ තිබුණේ නැත. 2019 ඔක්තෝම්බර් 2 වැනි දින විධිමත් මණ්ඩල අනුමැතිය සහ ගිවිසුම අත්සන් කරන තෙක් හෙයියන්තුඩුව ඉඩම රුපියල් ලක්ෂ 3ක මාසික කුලියට භාවිතා කිරීමට වැඩබලන ප්‍රධාන විධායක නිලධාරී විසින් අනුමත කරන ලදී. | | |
| එම්බීඑස්එල් අංගනයෙන් පිටත වාහන තබා ගැනීම | අ. 2018 ඔක්තෝම්බර් 30 වැනි දින සීපී එල්එන් - 6054 වාහනය සඳහා ක්‍රිෂ්ණරත්න සහ පුත්‍රයින් විසින් නිකුත් කරන ලද තක්සේරු වාර්තාවේ පිටපතෙහි | රු. 13,802 | වෝහාරික විගණන වාර්තාවෙන් කිසිදු අක්‍රමිකතා හෝ අඩුපාඩු හඳුනාගෙන නොමැත. වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවේ.<br>**වගකිවයුතු නිලධාරියා -** |

